# සිවිල් යුද තත්ත්වයක් පවතින සමාජයක් තුළ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇගයීමක් : උතුරු නැගෙනහිර යුද සමය තුළ ක්‍රියාත්මක වූ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරිත්ව ඇසුරින්.

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ටී.එම්.ටී.එච්.ගුණසේකර [1]**
**චාමින්ද අබේසිංහ [2]**

**සංක්ෂේපය**

වර්තමාන සුභසාධන රාජ්‍ය හමුවේ තෙවන ලොව රාජ්‍යයන් ට සංවර්ධන ක්‍රියාදාමයට තනි ව උරදීමේ ශක්තියක් නොමැති වීම හේතුවෙන් රාජ්‍ය නොවන සංවිධාන ඊට රුකුලක් සපයන ආකාරයට කටයුතු කරන ආකාරය දකගත හැකි ය. ඒ අනුව නූතනයේ රාජ්‍ය නොවන සංවිධාන විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වන ආකාරයක් දක්නට ලැබෙන අතර ඒ අතුරින්, තුන්වන ලෝකයේ ගැටුම් සහගත තත්ත්වයන් පවතින රටවල් සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට පෙනී යන්නේ රාජ්‍ය නොවන සංවිධාන ඇතැම් අවස්ථාවල දී සිය ක්ෂේත්‍රය අභිබවා යමින් කටයුතු කිරීමත්, රාජ්‍ය තුළ එම සංවිධාන ක්‍රියාත්මක වීමේ දී රාජ්‍ය විසින් සහනදායි ලෙස කටයුතු කිරීමට ඉඩ ප්‍රස්තා සලසා තිබෙන ආකාරයත් ය. රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධයෙන් වර්තමානයේ ඉදිරිපත්ව ඇති පොදු විවේචනය වන්නේ ඒවා සිය ක්ෂේත්‍රය සහ බලතල ඉක්මවා කටයුතු කරන බව යි. එය උතුරු නැගෙනහිර යුද සමයේ රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකළ ආකාරය අනුව පැහැදිලි වේ. එබැවින් මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර යුද සමයේ රාජ්‍ය නොවන සංවිධාන ජාතික ආරක්ෂාවට සිදු කොට ඇති බලපෑම හඳුනා ගැනීමයි. යුද්ධයේ දරුණුතම අවධිය වන 2004 - 2009 කාළ පරිච්ඡේදය තුළ උතුරු නැගෙනහිර පමණක් ක්‍රියාත්මක වූ රාජ්‍ය නොවන සංවිධාන අධ්‍යනයේ නියැඳිය ලෙස තෝරා ගෙන ඇත. මෙම අධ්‍යනය ප්‍රාථමික හා ද්විතීයික දත්ත මත පදනම් වන අතර ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී දේශපාලන වශයෙන් දැනුවත් පුද්ගලයන්ගෙන් සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබා ගත් අතර පොත්පත්, සඟරා, අන්තර්ජාල තොරතුරු ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස භාවිතා කරන ලදී. එසේම දත්ත විශ්ලේෂණ විධි ක්‍රම ලෙස විස්තරාත්මක විධි ක්‍රමය හා උපුටා ගැනීම් භාවිත කළ අතර දත්ත ඉදිරිපත් කිරීමේ දී පර්යේෂණය සඳහා අවශ්‍ය දත්ත ගුණාත්මක දත්ත විශ්ලේෂණය තුළින් මුලික ලෙස ම සලකා බැලීමට කටයුතු කරන ලදී. මෙම අධයනයෙන් එළඹිය හැකි ප්‍රධාන නිගමනය වන්නේ උතුරු නැගෙනහිර ක්‍රියාත්මක වූ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන තම මූලික අරමුණු ඉවත දා කටයුතු කරන්නට වීම ඔස්සේ ඒවායේ ක්‍රියාකාරීත්වය මත පදනම් වෙමින් විවිධ අංශ ඔස්සේ විවිධ ප්‍රමාණවලින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හානිකර අන්දමින් මතු වෙමින් පවතින බවත් එබැවින් මේ සම්බන්ධයෙන් වන අධ්‍යයනයක ආණ්ඩුවේ මැදිහත් වීම අත්‍යවශ්‍ය කාල වකවානුවක් පැමිණෙමින් තිබෙන අතර එහි දී මේ සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුවේ පවතින නීතිමය රාමුව තව දුරටත් ශක්තිමත් විය යුතු බව අවසාන වශයෙන් පෙන්වා දිය හැකි ය.

ප්‍රමුඛ පද : රාජ්‍ය නොවන සංවිධාන, උතුරු නැගෙනහිර යුද සමය, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකාව, සිවිල් යුද්ධය

*1. දේශපාපන විද්‍යාව, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*